# ත්‍රිපිටකාගත ආරාමික වාස්තුවිද්‍යා ද්‍රව්‍ය සහ ඒවායෙහි ශ්‍රී ලාංකේය භාවිතය

ආර්.ඩී.එස්. හේමලතා[1]


## Abstract

In the early days of establishment of the Buddhist order, the monks had a nomadic life. In the course of time, the system of living in one place started with the discharge of nomadic system. There arose the need for the systematic monastery. Accordingly, in the early days, for the monks, *vihāra* (an abode), *aḍḍhayoga* (a kind of house which has a roof in the shape of an eagle's wing), *pāsāda* (a terrace), *hammiya* (a storied building) and *guhā* (cave) were approved. Since then, from the selection of a suitable land for a monastery to its development, the matters have been preached from time to time by the Buddha. A detailed account of related scope can be discovered from many places such as *Cullavaggapali Senāsanakkhandhaka, Chantagharavata, āvāsikavata* as well as *Uposathakkhandhaka of Mahāvaggapāli.* Accordingly, wood, brick, stone, fabric, stone slabs and plaster were used as construction materials in the construction of monastery buildings in India in the 6th century. Further, various types of grass and leaves have been used for roofing.


1 කථිකාචාර්ය, පාලි හා බෞද්ධ අධ්‍යයන අංශය, කැලණිය විශ්වවිද්‍යාලය, ශ්‍රී ලංකාව.

After the third Buddhist council, Sri Lanka received Theravāda Buddhism which was recited by the elders. Accordingly, from the very beginning, the architect has used the Theravāda basket of descipline (vinaya piṭaka) in building Sri Lankan monasteries. In the construction of the elements of monastic building, the Sri Lankan artist has worked to implement architectural theories found in pali canon, while protecting the disciplinary basis of them and preserving the local identity. Accordingly, it is expected to carry out an investigative study on the application of elements of monastic building in the construction, and the literary and archeological factors currently available in history of Sri Lanka.

**Keywords:** Architecture, Construction methods, Monastic, Matirials of monastic builing, Senasanakkhandhaka of Chullavaggapāli

**සාකච්ඡාව**

ආරාමික වාස්තු විද්‍යාවට අදාළ පැනවීම් රාශියක් ථෙරවාද ත්‍රිපිටකයෙන් අනාවරණය කරගත හැකිය. විශේෂයෙන් ම එහිදී චුල්ලවග්ගපාළි සේනාසනක්ඛන්ධක, ජන්තාඝරවත, ආවාසිකවත මෙන්ම මහාවග්ගපාළි උපෝසථක්ඛන්ධක ආදි ස්ථාන ප්‍රධාන තැනක් ගනී. ආරාම සංකල්පයේ උපයෝගිතාව, සංවර්ධනය, විනයානුකූල පදනම මෙන්ම සැලසුම්කරණය, සංවිධානය, මෙහෙයවීම හා පාලනයට අදාළ කරුණු රාශියක් එමගින් අනාවරණය කරගත හැකිය. ඒ අතර උපයෝගිතාව අනුව ගොඩනැගිලි ඉදිකිරීමේදී භාවිත කළ හැකි ඉදිකිරීම් මාධ්‍ය වශයෙන් දැව, ගඩොල්, ගල්, රෙදි, ගල් පුවරු හා හුණු බදාම දක්වා තිබේ. සෙවිලි මාධ්‍ය වශයෙන් උළු, විවිධ තෘණ වර්ග හා කොළ වර්ග දක්වා ඇත. ත්‍රිපිටකයෙන් හෙළි කරන අදාළ ඉදිකිරීම් මාධ්‍යවල ශ්‍රී ලාංකේය භාවිතය පිළිබඳ විමර්ශනයක් මෙතැන් සිට සිදුකෙරේ.

## 01. දැව

ඉන්දියාවේ බෞද්ධ ආරාම ආශ්‍රිතව මුල් කාලයේ ගොඩනැගිලි ඉදිකිරීමේදී බහුලව දැව භාවිත කර ඇත. ඒ බව සණ ලී දඬු සිටුවා බිත්ති බඳින ලද බවත් බිත්ති කණුවල මුල දිරායාමට ලක්වූ බැවින් ලී විද කණු සිටුවීම (කුලුංක පාදය) ආරම්භ කළ බවත් ප්‍රකාශ කිරීමෙන් පැහැදිලි වේ.[2] එසේ සිටුවන ලද සණ ලී දඬු මත තිරස් ආකාරයට නැවත ලී අතුරන ලදී. බිත්තියේ ඇතුළතින් හා පිටතින් බදාම යෙදුවේ ඉන් අනතුරුව ය.[3] එසේ ඉදිකරන ලද ගොඩනැගිල්ලේ පියස්ස නිර්මාණය කෙරුණේ ද සණ ලී දඬු යොදා ගැනීමෙනි.[4] එසේ ම දොරපළුව, දොරබාව, දොරපොල්ල, අගුළුකණුව ආදිය දැවයෙන් නිර්මාණය කෙරුණි.

ආරම්භක යුගයේදී ඉදිකරන ලද ආරාමික ගොඩනැගිලි වැසි කාලයේදී ජලයෙන් යට විය. එයට පිළියමක් ලෙස ගොඩනැගිල්ල ඉදිකිරීමට නියමිත භූමිය පස්වලින් පුරවා ඒ මත ගොඩනැගිල්ල ඉදිකිරීමේ ක්‍රමය ක්‍රියාත්මක විය. පිහිටි පොළොවට වඩා උස්ව පිහිටන සේ පස් පිරවීමේදී බැම්මක් යෙදිය යුතුය. එම බැම්ම බැඳීමට ගඩොල්, ගල් මෙන්ම ලී දඬු යොදාගත හැකිය.[5]

මුල් කාලයේදී ආරාමික වාස්තුවිද්‍යා නිර්මාණ සඳහා ලංකාවේ බොහෝ සෙයින් දැව යොදාගෙන ඇත.[6] මේ යුගයේ ඉදිකිරීම් සම්බන්ධයෙන් සෘජු මැදිහත්වීමක් දැරුවේ වඩුවන්ය. එකල වඩු ඇඳුරන් මහ ඇඳුරන් යටතේ ද අනෙක් වඩුවන් මෙම දෙදෙනා යටතේ ද ශික්ෂණය ලබන්නට ඇත.[7] මේ බව සිව්වන මිහිඳු රජුගේ මිහින්තලා පුවරු ලිපියෙහි දක්වෙන "මහ වඩු ඇඳුරාට බොඩිවෙහෙර සේනත් වඩු ඇඳුරන් දෙදෙනාටත් කැටයම් වඩු අට දෙනාටත් උළුවඩු දෙදෙනාටත් යන මොවුන්ට වඩු දෙවැගම දිය

2 චුල්ලවග්ගපාළි, 2005, පි. 148.
3 එම, පි. 152.
4 එම, පි. 154.
5 චුල්ලවග්ගපාළි, 2005, පි. 154.
6 සිරිසෝම, 1993, පි. 05.
7 අමරවංශ හිමි, 1969, පි. 304.

යුතු ය" යන්න ප්‍රකාශ කිරීමෙන් පැහැදිලි වේ.[8] බුදුදහම හඳුන්වා දුන් මුල් යුගය තුළ ඉදිකරන ලද ගොඩනැගිලි බොහොමයක් සඳහා දැව භාවිත කළ බව පෙනේ. දීඝසන්ද ප්‍රාසාදය එබන්දකි. ලෝහප්‍රාසාදය නිර්මාණය කිරීමේදී දැව ප්‍රධාන අමුද්‍රව්‍යයක් වශයෙන් භාවිත කරන්නට ඇත. දුටුගැමුණු රජු විසින් ඉදිකළ එම ප්‍රාසාදයෙහි බැම් හා උපරි භාගයේ සියළු ඉදිකිරීම් දැවයෙන් ම ඉදි කරන්නට ඇත.[9] සද්ධාතිස්ස රාජ්‍ය සමයේ එය ගින්නෙන් විනාශවී ගියේ බහුල ලෙස දැව භාවිත කර ඉදිකර තිබූ බැවින් යැයි සිතිය හැකිය.

මේ අනුව ලංකාවේ මුල් කාලයේදී ආරාම ගොඩනැගිලි ඉදිකිරීම සඳහා ලී වඩුවන්ගේ සහය ලබාගෙන ඇත. සිව්වන මිහිඳු රජුගේ මිහින්තලා පුවරු ලිපියෙහි එවැනි ලී වඩුවන් දෙදෙනකු පිළිබඳ ව සඳහන් වන අතර ඉන් එක් කෙනකුට (ඉඩම්) කිරි එකක් බැගින් දියයුතු බව ද දක්වා තිබේ.[10]

ක්‍රි.ව. 1 හා 2 වන කාලවලට අයත් ආරාමික ගොඩනැගිලි ඉදිකිරීමේදී මූලික අමුද්‍රව්‍ය ලෙස ගල් යොදාගන්නා ලදී. එහෙත් දැව යොදාගැනීම එකල ද පෙර පරිදි සිදුවිය. විශේෂයෙන් ම ප්‍රාසාද ගොඩනැගිලිවල උඩු මහල තැනීමේදී දැව භාවිත කෙරුණි. සණ බාල්ක හා සණ ලෑලි යොදා ගනිමින් සොල්දොර නිර්මාණය කෙරුණි. දොර ජනෙල් සහ වහලය සඳහා දැව අවශ්‍ය විය. විශේෂයෙන් ම එකල සෙවිලි මාධ්‍යයක් ලෙස උළු භාවිත කර ඇති බැවින් වහලය මත පළමුව ලී අතුරා ඒ මත උළු සෙවිලි කළ බව පෙනේ.

ලංකාවේ මුල් කාලයේදී ඉදිකරන ලද ස්තූපවල වේදී (වැට) ඡත්‍ර, යූප හා යෂ්ටි සඳහා ද දැව යොදාගෙන ඇත. එහෙත් එවැනි අංග නිර්මාණයේදී දැව භාවිත කිරීමෙන් කලින් කලට එම අංග ප්‍රතිසංස්කරණය කරන්නට සිදුවිය. සංරක්ෂණ මාධ්‍යයක් ලෙස තෙල් පූජා කිරීම මෙකල දැකගත හැකි වන්නේ ගොඩනැගිලි ඉදිකිරීමේ ප්‍රධාන අමුද්‍රව්‍ය වශයෙන් දැව භාවිත කර ඇති බැවිනි.

8 Wicremasinghe, 1912, p. 90.

9 වික්‍රමගමගේ, 2006, පි. 63.

10 Wicremasinghe, 1912, p. 51.

එසේ ම සාමාන්‍ය ජනතාවගේ නිවාස පිළිබඳ සාධක අවමවීමටත් ගොඩනැගිලිවල දීර්ඝකාලීන පැවැත්මට බාධා පැමිණවීමටත් දැව නිර්මාණය ප්‍රබල ලෙස බලපා ඇත. ඒ අනුව මුල් කාලයේ ඉන්දියාවේ මෙන්ම මුල් කාලයේ ලංකාවේ ද ආරාම ගොඩනැගිලි ඉදිකිරීමේදී ප්‍රධාන අමුද්‍රව්‍යයක් ලෙස දැව භාවිත කර ඇති බව පෙනේ.

## 02. ගඩොල්

ඉන්දියාවේ බෞද්ධ ආරාම ඉදිකිරීම ආරම්භ වූ මුල් කාලයේ සිට ම එම නිර්මාණ සඳහා ගඩොල් භාවිත කර ඇත. සුදුසු මැටි වර්ග යොදා ගනිමින් ඒවා නියමිත ආකාරයට මැඩ ගඩොල් නිර්මාණය කෙරුණි. ආරාමවල බිත්ති නිර්මාණය කෙරුණේ එසේ තනාගන්නා ලද ගඩොල් භාවිත කිරීමෙනි.[11] මුල් කාලයේදී ඉදිකරන ලද ආරාම ගොඩනැගිලිවල වාතය ගමන් කිරීමට කවුළු නොතිබුණි. එබැවින් ගොඩනැගිල්ල ඇතුළත දුර්ගන්ධ ඇතිවිය. මේ නිසා ස්තූපයන්හි සතරැස් කොටුව ආකාරයට සිදුරු සිටින සේ ගඩොල් භාවිත කර වාකවුළු ඉදිකිරීම ආරම්භ විය.[12]

වැසි කාලයේදී ගොඩනැගිලි වැසි ජලයෙන් යටවිය. එබැවින් ගොඩනැගිල්ල ඉදිකිරීමට පෙර එම භූමිය පස් යොදා පුරවන ලදී. පුරවන ලද පස් විසිරීම වැළැක්වීමට ගඩොල් යොදා බැම්මක් ඉදිකෙරුණි. එසේ නිර්මාණය කරන ලද ගොඩනැගිල්ල පිහිටි භූමියෙන් මදක් ඉහළ තලයක පිහිටි බැවින් ඊට ගොඩවීම අපහසු විය. එබැවින් ගඩොල් භාවිත කර පියගැටපෙළක් නිර්මාණය කෙරුණි.[13]

මුල් කාලයේ ලංකාවේ ගොඩනැගිලි බහුතරයක් ගඩොල් භාවිත කර ඉදිකරන ලද ඒවාය. මිහිඳු මහ රහතන් වහන්සේ ලංකාවට වැඩම කළ සත්වන දිනයේ උන්වහන්සේට වැඩසිටීම සඳහා දෙවනපෑතිස්ස රජු විසින් තිස්සමහාරාමයෙහි වරිච්චි බිත්ති

11 චුල්ලවග්ගපාළි, 2005, පි. 170.

12 එම, පි. 134.

13 චුල්ලවග්ගපාළි, 2005, පි. 152.

යොදා ගින්දරින් මැටි වියළවා කුටියක් සකසා දෙන ලදී. එම මැටි ගින්දරින් වියළීමේදී කළු වර්ණ ගැන්වුණු බැවින් කාලප්‍රාසාද යන නම යෙදිණි.[14] මෙම කථා ප්‍රවෘත්තියට අනුව ක්‍රිස්තු පූර්ව යුගයේ සිට ම ලංකාවේ පිළිස්සූ ගඩොල් සෑදීමේ තාක්ෂණය තිබෙන්නට ඇති බව සැලකිය හැකිය.[15] ඉන්දියාවේ මෙන්ම ලංකාවේ ආරාමික ගොඩනැගිලිවල බිත්ති බැඳීමේදී ප්‍රධාන අමුද්‍රව්‍ය ලෙස භාවිත කර ඇත්තේ ගඩොල් ය. ඒ බව ලංකාවේ මුල් යුගයට අයත් දනට පවතින ආරාමික අවශේෂවලින් පැහැදිලි වේ. ඊට අමතරව ආරාම වටා බැමි බැඳීමේදී ද ප්‍රාකාර ඉදිකිරීමේදී ද ගඩොල් භාවිත කර ඇත.

ලංකාවේ මුල් යුගයේදී ගඩොල් භාවිත කරමින් ඉදිකරන ලද ආරාමික ගොඩනැගිලි අංගයක් ලෙස ස්තූප හැඳින්විය හැකිය. ථූපාරාමය, මහාථූපය, අභයගිරිය, ජේතවනාරාමය එම සුවිශාල ව්‍යාපෘති අතර වේ. දුටුගැමුණු රජු විසින් ඉදිකරන ලද මහාථූපයට ගඩොල් කපන්නට බාරදුන්නේ එක දිනකින් ගඩොල් කපා නිමකරන්නකුට නොවේ. ඔහු මැටි වනෙහි කොටා කුල්ලෙන් පොලා ගලෙහි අඹරවා මේ සඳහා අවශ්‍ය මැටි සකසා ගෙන ඇත්තේ එසේ කළවිට චෛත්‍යයෙහි තෘණ ආදිය නොවැඩෙන බැවිණි.[16] එකල ස්තූප නිර්මාණය කිරීමේදී බන්ධන මාධ්‍ය ලෙස භාවිත කර ඇත්තේ මැටි බදාම ය. මේ බව ජේතවනාරාම ස්තූපයෙන් හෙළිවේ. ථූපාරාම ස්තූපය ගොඩනැගීමේදී අභය වැවෙන් ගෙනා මැටි උපයෝගී කරගෙන ඇත.[17] මේ අනුව මුල්කාලයේ ස්තූප නිර්මාණයේදී ඒවා මැටියෙන් හෝ පසින් පුරවා පසුව ගඩොලින් ආවරණය කළ බව පෙනේ.

කුඹලුන් මුල් ඓතිහාසික සමය වන විට ශ්‍රේණි හා ගම් වශයෙන් සංවිධානය වී සිටියහ. මල්වතු ඔය සමීපයේ කුම්භකාර ගම්මානයක් විය. මිහින්තලා පුවරු ලිපියෙහි ද කුම්බල් යන නම

14 මහාවංසය, 1959, 15, පිටු. 222-223.

15 I.C. 1970, පි. 7.

16 මහාවංසය, 1959, පිටු. 30, 7-9.

17 මහාවංසය, 1959: පිටු. 17, 35-36.

දැකගත හැකිය.[18] මෙකල ඉදිකරන ලද දැවැන්ත වාරි කර්මාන්ත හේතු කොටගෙන නිෂ්පාදන මාධ්‍ය සපුරා ගැනීමේ අපහසුවක් ද නොවන්නට ඇත.

මේ අනුව ඉපැරණි ඉන්දියාවේ මෙන්ම ලංකාවේ ද ආරාමික ගොඩනැගිලි ඉදිකිරීමේදී ප්‍රධාන අමුද්‍රව්‍යයක් වශයෙන් ගඩොල් භාවිත කර ඇති බව පෙනේ.

**03. ගල්**

බුද්ධ කාලයේ ඉන්දියාවේ ආරාම ගොඩනැගිලි ඉදිකිරීමේදී ගල් ප්‍රධාන අමුද්‍රව්‍යයක් ලෙස භාවිත කර ඇත. ආරාමවල ආරක්ෂාවට බැමි ඉදිකිරීමේදී හා පියගැට තැනීමේදී ගල් යොදාගන්නා ලදී. ආරාමයේ ආරක්ෂාවට ඉදිකරන ලද ප්‍රාකාරය ඇතුළත පිහිටි බිම වැසි කාලයේදී මඩ සහිත විය. එබැවින් එම බිම් කොටසෙහි බොරළු විසුරුවන ලදී. එහෙත් ඇතැම් ස්ථාන බොරළු විසුරුවීමෙන් මඩවීම වැළැක්විය නොහැකි විය. එබැවින් ගල් පුවරු අතුරන ලද අතර ඒ මත පතිතවන ජලය බැසයාමට ප්‍රාකාරයේ එක් කෙළවරක සොරොව්වක් ඉදිකරන ලදී.[19]

ලංකාවේ මුල් කාලයේ ආරාමික ගොඩනැගිලි කටයුතු සඳහා කළුගල් භාවිත කර ඇත.[20] ක්‍රිස්තු පූර්ව යුගයට අයත් ලෙස සැලකෙන අභිලේඛනයන්හි ගල් වඩුවන් පිළිබඳ තොරතුරු සඳහන් වේ.[21] ගොරහැඩි කළුගල් භාවිත කරමින් මටසිළුටු කැටයම් කිරීම, ගල් ටැම් ආදිය නිර්මාණය කිරීම මේ යුගයේදී සිදුවිය. මීට අමතරව ප්‍රාග් බෞද්ධ ගොඩනැගිලි සහ වෙනත් ස්මාරකයන්හි ගල් පුවරු වැනි වාස්තුවිද්‍යාත්මක කොටස් පශ්චාත් බෞද්ධ ස්තූපකරණයේදී ප්‍රයෝජනයට ගෙන ඇත. බොහෝවිට ධාතු ගර්භයේ ආවරණ ගල් පුවරු සඳහා ඉහත සඳහන් ශිලාමය පුවරු යොදාගෙන තිබේ. කලින් තිබූ ගොඩනැගිලි ද්‍රව්‍ය පසුව ඉදි වූ ස්මාරක සඳහා

18 අමරවංශ හිමි, 1969: පි. 303.
19 චුල්ලවග්ගපාළි, 2005, පි. 154.
20 පුරාවිද්‍යා පාලන වාර්තා, 1960, පිටු. 63-65.
21 එම, පිටු. 63-65.

යොදාගැනීම පුරාණ සිංහලයන් ගොඩනැගිලි ඉදිකිරීමේදී අනුගමනය කළ සම්ප්‍රදායක් ව පැවත ඇත.[22]

ඉන්දියාවේ පසු කාලයේ ලෙන් කැණීමේදී සුවිශාල කළුගල් පර්වත යොදාගෙන තිබේ. ඒ බව බරාබර් කඳුවැටියේ ඇති අජන්තා, එල්ලෝරා වැනි ලෙන්වලින් පැහැදිලි වේ. ඉතාමත් විසිතුරු ආකාරයට පර්වතය හාරා කුටි කපා ලෙන් නිර්මාණය කිරීම මෙහිදී දැකගත හැකිය.

ලංකාවේ ගොඩනැගිලි ඉදිකිරීමේ ශිල්පයේ පුරාණ යුගයට අයත් ස්මාරක වශයෙන් භික්ෂු ලෙන් හඳුනාගත හැකිය. ලංකාවට පැමිණි මුල් ම ධර්මදූත කණ්ඩායමට විවේක ගැනීමට සුදුසු ලෙනක් දේවානම්පියතිස්ස රජතුමා විසින් මිහින්තලාවේ සූදානම් කර දී ඇත. එය ස්වභාවිකව පිහිටි ලෙනක් මනුෂ්‍ය වාසයට සුදුසු පරිදි පිරිසිදු කර සකසා දීමක් බව පෙනේ. කල්යාමේදී මෙබඳු ලෙන් මිහින්තලේ, වෙස්සගිරිය, සිතුල්පව්ව, රිටිගල, අරන්කැලේ ආදී ස්ථානවල නිර්මාණය විය. ඒ අනුව ස්වභාවික පරිසරයට හානි නොවන සේ පිහිටි පර්වත කුහරය පිරිසිදු කරවා මුල්කාලීන ලෙන් නිර්මාණය කෙරුණි. පසුව වැසි ජලය ලෙන තුළට ගලා ඒම වැළැක්වීමට කටාරම් කැපීම ආරම්භ විය. පර්වතය ඇතුළට හාරා අවශ්‍ය ඉඩ ප්‍රමාණය සපයා ගැනීමේදී ගල් වැඩ යොදාගන්නට ද සිදුවිය. මුල් කාලයේ සිට ම දේශීය ස්වරූපයක් ගත් ලංකාවේ ලෙන් සම්ප්‍රදාය වෙනස් වූයේ සංඛ්‍යාත්මකව භික්ෂූන් වහන්සේලා වැඩිවීම තුළිනි. කල්යාමේදී තෝරාගත් පර්වතයේ ගඩොල් බිත්ති බැඳීමත්, කවුළු, දොරටු තැබීමත් ඇතැම් විට ගල් සිවිලිම තැනීමත් සිදුවිය. ඇතැම් ලෙන්වල චිත්‍ර ඇඳීම ද සිදුකර ඇත (උදාහරණ: වෙස්සගිරිය).

ඊට අමතරව ආරාමවල බත් ඔරු, කැඳ ඔරු, බෙහෙත් ඔරු, පාදෝණි ආදිය නිර්මාණය කිරීම සඳහා තනි කළුගල් භාවිත කර ඇත.[23] මෙකල වැසිකිලි, කැසිකිලි ආදිය නිර්මාණය කෙරුණේ ද

22 සිරිසෝම, 1993, පි. 7.
23 Paranavitana, 1933, p. 133.

කළුගල් භාවිතයෙනි. එසේ ම පෙර නියමයන් හා පූජාවන් ලියා තැබීම සඳහා වැඩි වශයෙන් භාවිත කර ඇත්තේ ද කපා ඔපමට්ටම් කරගන්නා ලද ශිලා ස්තම්භ ය.

මේ අනුව ඉන්දියාවේ මෙන්ම ලංකාවේ ද ආරාම ගොඩනැගිලි ඉදිකිරීමේදී ශිලා ස්තම්භ හා සුවිශාල කළුගල් පර්වත යොදාගෙන ඇති බව පෙනේ. විශේෂයෙන් ම කල්පවතින ද්‍රව්‍ය භාවිතයට ඉන්දියානු කලා ශිල්පියා යොමුවී ඇත්තේ මෞර්ය යුගයේදී ය. ඊට සාපේක්ෂව ලාංකේය කලා ශිල්පියා වැඩි වශයෙන් අනුරාධපුර මධ්‍ය භාගයේ සිට සිය නිර්මාණවල දීර්ඝකාලීන පැවැත්ම කෙරෙහි අවධානය යොමුකර තිබේ.

**04. රෙදි**

ක්‍රි.පූ. 6 වන සියවසේ ඉන්දියාවේ ඉදිකරන ලද මුල් කාලීන ආරාමවල කුටි වෙන් කිරීමක් සිදුවූයේ නැත. විවෘතව පැවති ශාලාවක් සේ නිර්මාණය කෙරුණු ආරාමය තුළ භික්ෂූන් වහන්සේලා ද ගිහි ජනතාව ද ගැවැසුණහ. එවැනි විවෘත ශාලාවක සැතපීම භික්ෂූන් වහන්සේලාට සුදුසු නොවූ බැවින් සැතපීම සඳහා ශාලාව තුළ වෙනම කුටියක් නිර්මාණය කෙරුණි. ඒ සඳහා තිර රෙදි භාවිත කෙරුණි.[24]

එහෙත් නොහික්මුණු ඇතැම් භික්ෂූන් තිර රෙද්ද මැත්කරමින් හා තිර රෙද්ද උඩින් කුටියේ සැතපී සිටින භික්ෂූන් දෙස බැලූහ. මේ නිසා එම කුටියේ තිර රෙදි ඉවත් කොට ගඩොලින් වහලය දක්වා උස්වන පරිදි බිත්ති බඳින ලදී. බිත්ති උස් කිරීමෙන් කුටිය තුළට හිරු එළිය හා වාතය ගමන් කිරීමට බාධා පමුණුවයි. මේ නිසා වාකවුළු ද දැල් කවුළු ද කුරු කවුළු ද ඉදිකෙරුණි. එම කවුළු අතරින් ලෙහෙන්නු, වවුලෝ වැනි සතුන් කුටියට පැමිණියහ. මෙය සැතපී සිටින භික්ෂූන්ට ද සිවුරු ආදි ලඝු භාණ්ඩවලට ද හානිදායක විය. එබැවින් එම කවුළුවලට කුඩා සිදුරු සහිත රෙද්දක් ගසන ලදී.[25]

24 චුල්ලවග්ගපාළි, 2005, පි. 147.
25 චුල්ලවග්ගපාළි, 2005, පි. 134.

එහෙත් ලංකාවේ මුල් කාලයේ සිට ම ආරාම ගොඩනැගිලි ඉදිකිරීමේදී රෙදි භාවිත කර ඇත්තේ අල්ප වශයෙනි. විශේෂයෙන් ම එකල ආරාම ගොඩනැගිලි ඉදිකිරීමට රෙදි යොදාගත් අවස්ථා දෙකක් සොයාගත හැකිය. ඉන් එක් අවස්ථාවක් වන්නේ ගොඩනැගිලි ආකෘතිය නිර්මාණයට රෙදි යොදාගැනීමය. දෙවැනි අවස්ථාව වන්නේ මහාථූපයේ වැඩ අවසන් කිරීමට පෙර දුටුගැමුණු රජු කායික වශයෙන් දුර්වල වූයෙන් එහි වැඩ නිමකළ බව පෙන්වීමට රෙදි යොදා ගැනීමයි. ඒ බව මල්තිස්ස කුමරුන් විසින් තම බෑයා දුර්වල බැවින් සන්නාලියන් ලවා සුදු පිළියෙන් සැට්ටයක් කරවා ඒ සැට්ටයෙන් සෑය වස්වා, සිත්තරුන් ලවා එහි පිළීකඩ ද පූර්ණඝට පන්තීන් ද පසඟුල් ද කරවන ලදැයි යන වාර්තාවෙන් පැහැදිලි වේ.[26] මෙවැනි ආකාරයේ පූජාවක් පිළිබඳ තොරතුරු කල්‍යාණවතී බිසවගේ රුවන්වැලිසෑය පුවරු ලිපියෙන් අනාවරණය කරගත හැකිය. ඒ අනුව සිරිසඟබෝ පරාක්‍රමබාහු රජවරුන්ගේ භාණ්ඩාගාරයෙහි පරිපාලන තනතුරු දැරූ පිරිමතුබිම් විජයානාවන් හා සුමේධා දේවිය ද තොටදනවු දෙවල්තාවන් ද එකතු වී රුවන්වැලි දාගැබට විශේෂ පූජාවන් කරන්නෙමුයි සිතා අට දහස් අටසිය අසූවක් පමණ වූ නොයෙක් අන්දමේ රෙදිවලින් කළ විශේෂ වූ වැස්මක ඇතුළුකොට චූඩාමණී චෛත්‍යයේ පිළිබිඹුවක් ලෙස සරසා මංගල වස්ත්‍ර දහසය අන්දවා විශේෂ පූජාවක් කර තිබේ.[27]

සිව්වන මිහිඳු රාජ්‍ය කාලයෙහි මංගල ශිලා ප්‍රතිමාගෘහයෙහි කාර්යයන් කළ නිලධාරියාට බුද්ධාභිෂේකයට තෙල් ගන්නා කෝප්පයක් හා දිය පෙරන අමුරෙද්දක් ලබාදුන් බව කියැවේ.[28] ඒ අනුව ආරාමයෙහි විවිධ කටයුතු සඳහා එකල රෙදි භාවිත කරන්නට ඇති බව පෙනේ.

එහෙත් ගොඩනැගිලි වාකවුළු තැනීමේදී ත්‍රිපිටකයේ දැක්වෙන ආකාරයට රෙදි භාවිත කළ බවක් නොපෙනේ. දැනට හමුවී ඇති ක්‍රි.ව. 12 වන සියවසට අයත් ගොඩනැගිලි වාකවුළු නිර්මාණය

26 මහාවංසය, 1959, පි. 32, 1-4.

27 Paranavitana, 1943, page. 255-256.

28 Wicremasinghe, 1912, p. 89-90.

කර ඇත්තේ ශිලා භාවිතයෙනි. මේ අනුව ලංකාවේ මුල් කාලයේ සිට ම ආරාම ගොඩනැගිලිවල වාකවුළු නිර්මාණයේදී දැව හා ශිලා භාවිත කරන්නට ඇති බව පෙනේ. එසේ වුවත් ත්‍රිපිටකයේ දක්වෙන ආකාරයට නිර්මාණ මාධ්‍යයක් ලෙස රෙදි භාවිත කර ඇති බව ඉහත සඳහන් සාධකවලින් පැහැදිලි වේ.

**05. හුණුගල්**

බුද්ධ කාලයේ ඉන්දියාවේ ආරාම නිර්මාණයේදී ඉදිකිරීම් මාධ්‍යයක් ලෙස හුණු යොදාගත් බවට සාධක විනය පිටකයේ ස්ථාන කිහිපයකින් සොයාගත හැකිය. "රාජා මාගධො සෙනියො බිම්බිසාරො සංඝස්ස අත්‍ථාය සුධාමත්තිකාලෙපනං පාසාදං කාරාපෙතුකාමො හොති" යනුවෙන් දක්වා ඇති තැන සුදු හුණු මැටි සමග මිශ්‍රකොට බදාම ආලේප කළ ප්‍රාසාදයක් පිළිබඳව කියැවේ. භික්ෂූන් වහන්සේලාගේ ප්‍රයෝජනය සඳහා මෙම ප්‍රාසාදය ඉදිකලේ බිම්බිසාර රජු විසිනි.[29]

විනය පිටකයෙන් හෙළිවන ආකාරයට බුද්ධ කාලයේ නිර්මාණය කරන ලද ආරාම ගොඩනැගිලි සෙවිලි කිරීම සඳහා උළු, ගල් පුවරු, හුණු බදාම, තණ හා කොළ යන සෙවිලි වර්ග යොදාගෙන ඇත. ඒ බව "අනුජානාමි භික්ඛවෙ පඤ්ච ඡදනානි ඉට්ඨකාඡදනං සිලාඡදනං සුධාඡදනං තිණඡදනං පණ්ණඡදනන්ති" යන්නෙන් පැහැදිලි වේ.[30] ඒ අනුව, එකල ආරාම ගොඩනැගිලිවල බිත්ති පිරියම් කිරීමේදී පමණක් නොව වහලය සෙවිලි කිරීමට ද හුණු යොදාගෙන ඇති බව පෙනේ.

ලංකාවේ මුල්කාලය තුළ මැටි බදාමවලට මූලිකත්වය ලැබී ඇතත් කල්යාමේදී ශක්තිමත් නිපැයුමක් ලෙස හුණු බදාම යොදාගෙන ඇත. ගොඩනැගිලිවල පාදම, පියගැට පේළි හා කොරවක්ගල් නිර්මාණය කිරීමේදී හුණුගල් භාවිත කර තිබේ. මිහින්තලේ පැරණි උපෝසථඝරයෙන් මේ කරුණ තහවුරු කරගත හැකිය. ලජ්ජිතිස්ස රාජ්‍ය කාලයේදී රුවන්වැලි සෑයේ තුන්මාල් පේසාවෙහි සෘජුකෝණාස්‍රාකාර හුණු කුට්ටි අල්ලන ලදී. මැනවින්

29 චුල්ලවග්ගපාළි 2005, පි. 156.
30 චුල්ලවග්ගපාළි, 2005, පි. 156.

කපන ලද මෙම හුණු කුට්ටි අඩියක් පමණ දිග ඒවා විය.[31] 2 වන ශත වර්ෂයේදී ස්තූපවලට වාහල්කඩ එකතු වූ අතර එහි බොරදම් නිර්මාණය කෙරුණේ ද හුණු බදාමයෙනි.

අභයගිරිය විහාර භූමිය කැණීමේදී විපරීත හුණුගල් කැබැල්ලක් හා ස්ඵටික කැබැලි කිහිපයක් ද ස්ඵටික හුණුගලින් නිමකරන ලද මදක් විශාල භාණ්ඩයක් ද සොයාගෙන ඇත.[32]

ඊට අමතරව මූර්ති නිර්මාණය සඳහා ද හුණුගල් යොදාගෙන ඇත. පන්කුලිය අශෝකාරාමයේ දක්නට ලැබෙන හිඳි බුද්ධ ප්‍රතිමාව ඔපදැමූ සුදු හුණුගලින් නිර්මාණය කරන ලද්දකි. මෙකල ඉදිකරන ලද සඳකඩපහණ වැනි නිර්මාණවලට ද හුණුගල් භාවිත කළ බව පෙනේ. හුණුගලින් නිර්මාණය කරන ලද මූර්ති කොටස් රාශියක් අභයගිරිය විහාර භූමිය කැණීමේදී සොයාගෙන ඇත.[33]

අභයගිරිය දාන ශාලාව කැණීමේදී මුහුදු බෙලිකටු කැබැලි 45ක් පමණ සොයාගෙන ඇත. මේ සෑම බෙලිකටු කැබැල්ලක් මත ම හුණු විවිධ ප්‍රමාණයෙන් තැන්පත් වී ඇත. හුණු සැකසීම සඳහා මුහුදු බෙල්ලෝ ද යොදාගත් බවට එය සාධකයකි.[34]

අනුරාධපුර යුගයේ මැද භාගය වන විට ස්ථිර වශයෙන් හුණු බදාම භාවිත කළ බව සීගිරියෙන් තහවුරු කළ හැකිය. ඩොලමයිට් පිලිස්සීමෙන්, මුහුදුබඩ වෙරළින් ලබාගත් කොරල් මගින් හා සිප්පි වැරටි මගින් එකල හුණුගල් ලබාගන්නට ඇත. සිව්වන මිහිඳු රජු විසින් එකල සිටි අළුහුණු පුලුස්සන්නන්ට ජීවනෝපාය සඳහා සුනුබොල් දෙවැගම ලබාදුන් බව ප්‍රකාශ කිරීමෙන් මෙය වඩාත් පැහැදිලි වේ.[35]

නිධිවලින් ලබාගත් හුණු පෝරණුවල පිලිස්සීම මගින් අළුහුණු තනා ගැනීමට එකල ශිල්පීහු දැන සිටියහ. භාතිකාභය

31 පරණවිතාන, 1959, පි. 252.

32 අභයගිරිය ව්‍යාපෘතිය කැණීම් වාර්තා, 1988, පි. 139.

33 එම, පි. 142.

34 එම, පි. 143.

35 Wicremasinghe, 1912, p. 90.

රජු මහාථූපයේ ආලේප කිරීම සඳහා ගැල් සීයයක පමණ මුතු බෙල්ලන්ගේ හුණු තල තෙලින් අනා බදාමයක් සකසා ඇත.[36]

වාස්තුවිද්‍යා කර්මාන්තයේදී හුණු බදාම යොදාගැනීමේ උත්කර්ෂවත් අවස්ථාව වන්නේ පොළොන්නරු යුගය යි. ලංකාතිලක, තිවංක පිළිමගේ වැනි විහාරවල බොකු වහල තැනීමේදී ගඩොල් බැමි මුළුමනින් ම හුණු බදාම යෙදීමෙන් ශක්තිමත් කර ඇත.

මේ අනුව විනය පිටකයේ දක්වෙන ආකාරයට හුණු, සෙවිලි මාධ්‍යයකට වඩා ශක්තිමත් බදාමක් ලෙස ලංකාවේ මුල් කාලයේ සිට ම භාවිත කර ඇති බව පෙනේ. ඊට අමතරව ගොඩනැගිලි පිරියම් කිරීමේ මාධ්‍යයක් ලෙස ද ගොඩනැගිලි දොරටු අලංකරණය සඳහා ද හුණුගල් භාවිත කර තිබේ.

**06. උළු**

ක්‍රි.පූ. 6 වන සියවසේ ඉන්දියාවේ ඉදිකරන ලද ආරාමික ගොඩනැගිලි සෙවිලි කිරීමේදී වැඩි වශයෙන් භාවිත කර ඇත්තේ තණ සෙවිල්ල ය. ඒ බව තණ පියස්සේ සිටි සර්පයකු එක්තරා භික්ෂුවකගේ උරහිස මත වැටුණු බව සඳහන් කිරීමෙන් පැහැදිලි වේ.[37] තණ සෙවිල්ලෙන් ශීත හා උෂ්ණ දැණුනි. එබැවින් පසු කාලයේදී ඉදිකරන ලද ගොඩනැගිලි සඳහා වැඩි වශයෙන් උළු භාවිත කෙරුණි.[38]

ලංකාවේ මුල් කාලයේදී ඉදිකරන ලද ගොඩනැගිලිවල පියස්ස සෙවිලි කිරීමේදී විනය පිටකයේ දක්වා ඇති සෙවිලි වර්ග අතරින් කිහිපයක් ම යොදාගෙන ඇත. දෙවනපෑතිස්ස රජු ඉදිකරන ලද කාලප්‍රාසාදයේ පියස්ස සෙවිලි කළේ කුමන ද්‍රව්‍යයක් භාවිත කිරීමෙන් දැයි නිශ්චිතව සොයාගත නොහැකිය. එහෙත් ඊට පසුව දුටුගැමුණු රජු විසින් ඉදිකරන ලද ලෝහප්‍රාසාදයේ දැව පියැස්ස මත තඹ උළු සෙවිලිකර තිබිණි.[39] එසේ ම රත්නප්‍රාසාදයේ

36 මහාවංසය, 1959, පිටු. 34,46-47

37 චුල්ලවග්ගපාළි, 2005, පි. 148.

38 එම, පි. 344.

39 මහාවංසය, 1959, පි. 27,42.

ද්‍රවයෙන් සාදන ලද පියැස්ස මත තද නිල්පාට උළු සෙවිලිකර තිබුණි.[40] මෙකල උළුවඩුවන් (ඉට්ඨකා) වෙනම ශ්‍රේණියක් ලෙස සිටි බව පෙනේ.[41]

එසේම සුප්‍රසිද්ධ සමාධි බුදු පිළිමයට පිටුපසින් ඇති සංඝාරාමයට සම්බන්ධ ජන්තාඝරයෙහි පියැස්ස මත උළු සෙවිලිකර තිබූ බව එහි ඇතුළත හා පිටත තැන්පත්ව තිබූ සණ උළු තට්ටුවෙන් පැහැදිලි වේ.[42] ඒ අනුව ලංකාවේ මුල් කාලයේ සිට ම ඉදිකරන ලද ආරාම ගොඩනැගිලි සෙවිලි මාධ්‍ය ලෙස උළු භාවිත කරන්නට ඇති බව මෙයින් පැහැදිලි වේ. එම උළු විවිධ වර්ණවලින් සමන්විතව තිබෙන්නට ඇති බව පෙනේ.[43]

### 07. යකඩ

මීට අමතරව ත්‍රිපිටකයේ සඳහන් නොවෙන එහෙත් ලංකාවේ මුල් කාලයේදී ආරාම ගොඩනැගිලි ඉදිකිරීම සඳහා භාවිත කරන ලද ද්‍රව්‍ය රැසක් පිළිබඳ තොරතුරු සොයාගත හැකිය. එම ද්‍රව්‍ය අතර යකඩ ප්‍රධාන තැනක් ගනියි. ශිලා හැසිරවීමට මෙන්ම ඉදිකිරීම් සඳහා ආයුධ නිෂ්පාදනය කර ගැනීමට යකඩ අවශ්‍ය විය. පූර්ව බ්‍රාහ්මී ලිපිවල කබර යන නමින් දක්වෙන්නේ කම්මල්කරුවන් නැතහොත් යකඩ වැඩ කළ අයයි. ක්‍රි.ව. 6 වන සියවසෙහි පමණ සිට තද කළු ගලෙන් කලා අංග නිර්මාණ කිරීම පිණිස මොවුන්ගේ සේවය අත්‍යවශ්‍ය වන්නට ඇත. සීගිරිය, යාපහුව, තිස්සමහාරාමය වැනි ස්ථානවලින් ක්‍රි.ව. 2-5 වැනි සියවස්වලට අයත් යකඩ නිෂ්පාදන පිළිබඳ තොරතුරු ලැබී තිබේ. පුරාණ ලාංකිකයන් යකඩ පිළිබඳව දැන සිටින්නට ඇති බව බදුල්ල දිස්ත්‍රික්කයේ හල්දුම්මුල්ල ප්‍රදේශයේ කරන ලද සුසාන කැණීමේදී අනාවරණය විය.[44] අභයගිරිය විහාර භූමිය කැණීමේදී යකඩවලින් නිමවන ලද මෙවලම් 183ක් පමණ සොයාගෙන ඇත. මේ සැම යකඩ නිමවුමකම මුල්

40 ලගමුව, 2002, පි. 134.

41 Wicremasinghe, 1912, p. 90.

42 කුලතුංග, 2004, පි. 53.

43 අභයගිරිය ව්‍යාපෘතිය කැණීම් වාර්තා, 1988, පි. 133.

44 කැණීම් වාර්තාව, 2010.

ස්වරූපය වෙනස්ව ඇති බැවින් නිර්මාණ හඳුනාගැනීමට අපහසුය. එහෙත් මේවා අතර විවිධ අවශ්‍යතා සඳහා නිමවන ලද භාණ්ඩ ද විය.[45]

විනය පිටකයේ යකඩ භාවිතය පිළිබඳ කරුණු සඳහන් නොවෙතත් ගල් පුවරු භාවිතය පිළිබඳ කරුණු හෙළිදරව් වේ.[46] එම ගල් පුවරු නියමිත ලෙස පිරිමැද සකසා ගන්නට විවිධ ආයුධ වර්ග භාවිත කරන්නට ඇත. කෙසේ වෙතත් ලංකාවේ මුල් කාලයේදී ආරාම ඉදිකිරීමේ කටයුතු සඳහා යකඩවලින් නිර්මාණය කරන ලද ආයුධ නිෂ්පාදන යොදාගත් බව පැහැදිලිය.

**08. තඹ**

ත්‍රිපිටකයේ ආරාම නිර්මාණය පිළිබඳව තොරතුරු සඳහන් කරන ස්ථානවල තඹ පිළිබඳ කරුණු සොයාගත නොහැකිය. එහෙත් ලංකාවේ මුල් කාලයේ සිට ම විවිධ නිෂ්පාදන සඳහා තඹ භාවිත කර තිබේ. මහාථූපයට අවශ්‍ය වූ තඹ ලබාගෙන ඇත්තේ තම්බපිට්ඨයෙනි.[47] අනුරාධපුර යුගයේ භික්ෂු විනයකර්ම සඳහා ඉදිකරන ලද ප්‍රධාන ගොඩනැගිල්ල හැඳින්වීමට ලෝහප්‍රාසාද යන නම භාවිත කර ඇත්තේ ද එහි තඹ උළු සෙවිලිකර තිබූ බැවිණි.[48] එකල තඹවිට නම් ගම තඹලෝ උපන් බව කියැවේ.[49] එහෙත් තඹවලට තිබූ මූල්‍යමය වටිනාකම වැඩි නිසාත් එම ද්‍රව්‍යයේ දුර්ලභත්වය නිසාත් වාස්තුවිද්‍යා ඉදිකිරීම්වලදී තඹ ප්‍රමුඛත්වයක් ලබා නොමැත.

ඇතුළුනුවර කැණීමේදී තඹ කර්මාන්තය පිළිබඳ දැනුම ඊටත් පෙර සිට දැන සිටි බව අනාවරණය කරගෙන තිබේ.[50] ක්‍රි.පූ. 3 සිට ක්‍රි.ව. 1 දක්වා වන පූර්ව බ්‍රාහ්මීය ලිපිවල තඹකර, කබර, මණිකර,

45 අභයගිරිය ව්‍යාපෘතිය කැණීම් වාර්තා, 1988, පි. 137.
46 චුල්ලවග්ගපාළි, 2005, පි. 154.
47 මහාවංසය, 1959, පිටු. 28,16.
48 එම, පිටු. 27,42-43.
49 එම, පිටු. 28,17.
50 Deraniyagala, 1992, p. 719.

කුබල, කබොජිය, පුග, පූගියත වැනි වෘත්තිකයන් හා ශ්‍රේණි පිළිබඳව සඳහන් වේ.[51]

ඊට අමතරව අභයගිරිය විහාර භූමිය කැණීමේදී දිරාපත්ව ගිය ගණකමින් යුතු තඹ තහඩු කැබලි කිහිපයක් ද මිණිගෙඩියක ඉහළ කොටසක් ද තහඩුවක් සහිත බඳකින් යුතු ඇණයක් ද මැද සිදුරක් ද ඇති සෙන්ටි මීටර් 21ක් විෂ්කම්භයකින් යුතු කවාකාර තහඩුවක් ද තඹ උළු කැබැල්ලක් ද සොයාගෙන ඇත.[52] අභයගිරි තඹ සන්නස ආයත චතුරශ්‍රාකාර වූවකි. මහායානයට අයත් ගාථා පෙළක් ලිවීම සඳහා එය භාවිත කර ඇත.[53] එසේ ම මිහින්තලේ ඉදිකටුසෑය ස්තූපයෙන් ද මහායානයට අයත් ධර්ම කොටස් කිහිපයක් ලියූ තඹ තහඩු කැබලි හතළිස්හයක් සොයාගෙන තිබේ.[54]

**09. රන්**

විනය පිටකයට අනුව දෙවන ධර්ම සංගායනාවට හේතු වූ විශාලානුවර වජ්ජිපුත්තක භික්ෂූන් වහන්සේලාගේ දස වස්තුව අතර අවසන් ඉල්ලීම වූයේ රන් හා රිදී (ජාතරූපරජත) පිළිගැනීමට අවසර දිය යුතු බවයි.[55] භික්ෂූන් වහන්සේලා රන් හා රිදී ඉල්ලුවේ මේ කාලය වන විට ඒවා වැඩි මූල්‍යමය වටිනාකමක් හිමිකරගෙන තිබූ බැවිනැයි සිතිය හැකිය. එකල ආරාම ඉදිකිරීමේදී හෝ ආරාම අලංකරණයේදී රන් හා රිදී යොදාගත් බව සඳහන් නොවේ. සංඝමිත්තා තෙරණින් වහන්සේ ඉන්දියාවේ සිට ගෙනෙන ලද ශ්‍රී මහා බෝධි ශාඛාව සුගන්ධ ද්‍රව්‍ය මිශ්‍ර වූ පසින් පිරූ රන් කටාරමක තිබූ බව සඳහන් ය.[56] ඉන්දියාවේ මෞර්ය යුගය වන විට රන් භාවිතය කිසියම් ආකාරයකට දියුණු වී ඇති බව මෙයින් පැහැදිලි වේ.

---

51 Paranavithana, 1970, page, xcv-xcviii.
52 අභයගිරිය ව්‍යාපෘතිය කැණීම් වාර්තා, 1988, පි. 138.
53 Wicremasinghe, 1912, p. 39.
54 Paranavithana, 1943, p. 239.
55 චුල්ලවග්ගපාළි, 2005, පි. 566.
56 මහාවංසය, 1959: පි. 19,56.

ඉසුරුමුණිය හා මණ්ඩාගල විහාර ලිපිවල දක්වෙන තලදර, තුලදර යන වචන රන්කරුවන් හැඳින්වීමට භාවිත කර ඇත.[57] විශේෂයෙන් ම ස්තූප නිර්මාණයේදී රන් යොදා ගැණින. ථූපාරාමයෙහි තිබූ රන්පට අවස්ථා කිහිපයකදී ම පැහැර ගැනීමට ලක්ව තිබේ. ලෝහප්‍රාසාදයෙහි රනින් නිමවන ලද ජලය තබන සැළියක් ද කිණිස්සක් ද විය.[58]

එසේ ම ලංකාවේ මුල් කාලයේ සිට ම සුළු වශයෙන් ආරාම ගොඩනැගිලි අලංකරණය සඳහා මෙන්ම ලේඛන කලාව සඳහා ද රන් යොදාගෙන ඇත. ඒ බව ක්‍රි.ව. 126-170 ට අයත් වසභ රජුගේ වල්ලිපුරම් රන් සන්නස (*V*allipuram Gold Plate Insciption) හා ක්‍රි.ව. 9-10 සියවස අතර කාලයට අයත් අනුරාධපුර ජේතවන විහාර සංකීර්ණයෙන් හමුවී ඇති පංචවිංසතිසාහශ්‍රිකා ප්‍රඥාපාරමිතා සූත්‍ර මහායාන ග්‍රන්ථයේ රන් පත්තිරු (Darmadhātu) ආදියෙන් පැහැදිලි වේ.[59] මෙම ලේඛන දෙකම දනට කොළඹ කෞතුකාගාරයේ මැදිරි අංක 1හි තැන්පත් කර ඇත.

**10. මැණික්**

ත්‍රිපිටකයේ මැණික්, මුතු, රන්, පබළු ආදි ද්‍රව්‍ය ආරාම ඉදිකිරීමේදී හෝ අලංකරණයේදී යොදාගත් බවට සාධක සොයාගත නොහැකිය. එහෙත් ලංකාවේ මුල් කාලයේදී මෙම ද්‍රව්‍ය ආරාම ගොඩනැගිලි අලංකරණය සඳහා යොදාගෙන ඇත.

ලංකාවේ මුල් කාලයේදී ඉදිකරන ලද ස්තූප ඡත්‍රවලට මැණික් ඇල්ලීම ජනප්‍රියව පැවතිණි. ධාතුසේන, පළමු වන අග්බෝ ආදි රජවරු මහාථූපයෙහි ඡත්‍ර විශාල මාණික්‍යවලින් අලංකාර කළහ. සංඝතිස්ස රජු විශාල මැණිකක් මහාථූපය මුදුනෙහි පිහිටුවන ලදී.[60] එකල මැණික් කපන්නන් හඳුන්වා ඇත්තේ මණිකාර යනුවෙනි. ඔවුන් අතර ද මහ ඇඳුරෝ හා දෙටු ඇඳුරෝ සිටියහ. සිව්වන

57 Paranavithana, 1970, p. 6,80.

58 Paranavithana, 1970, පි. 27,40.

59 Paranavithana, 1943, p. 237.

60 මහාවංසය, 1959, පිටු. 66-68.

මිහිඳු රාජ්‍ය කාලයේදී මණිකාර මහ ඇඳුරන් දෙදෙනෙක් සිටි බවත් ඉන් එක් කෙනෙකුට (ඉඩම්) කිරි තුනක් ලැබුණු බවත් සඳහන් වේ.[61] ලෝහප්‍රාසාදයෙහි සප්තවිධ රත්නයෙන් කරන ලද අෂ්ට මංගලාකාර රූප තිබූ බව සඳහන් ය.[62] ඊට අමතරව ගොඩනැගිලි අලංකරණය සඳහා මිණි, මුතු, රිදී, පබළු ආදි ද්‍රව්‍ය යොදාගෙන ඇත.[63] පබළු සුදු හා කළු වර්ණවලින් සමන්විත වූ අතර ඇතැම් විට කෘත්‍රිම ආලේපන හෝ බදාමවලින් නිපදවා තිබේ.[64] එහෙත් මැණික් විවිධ ආරාමික ගොඩනැගිලි අංග අලංකරණයට මිස ඉදිකිරීම්වලදී යොදාගත් බවක් නොපෙනේ.

**11. ඇත්දත්**

ක්‍රි.පූ. 6 වන සියවසේ ඉන්දියාවේ ආරාම ගොඩනැගිලි ඉදිකිරීමේදී ඇත්දත් භාවිත කළ බවක් ත්‍රිපිටකයේ සඳහන් නොවෙතත් ලංකාවේ මුල් කාලයේදී කැටයම් කර්මාන්තය සඳහා හා අලංකරණ කටයුතු සඳහා ඇත්දත් භාවිත කර ඇති බව පෙනේ. 1 වන ජෙට්ඨතිස්ස රජු විසින් ඇත්දත් කැටයම් ශිල්පය ප්‍රගුණ කොට ඒ දැනුම ව්‍යාප්ත කිරීමේ කාර්යයයේ නිරත විය.[65] ඊට අමතරව වෙස්සගිරිය ලිපියේ 'දටික' යන වචනය දැකගත හැකිය.[66]

මේ අනුව ත්‍රිපිටකයෙන් හෙළිවන ආරාම වාස්තුවිද්‍යා ද්‍රව්‍ය ලංකාවේ මුල් කාලයේ සිට ම ආරාම ගොඩනැගිලි ඉදිකිරීමේදී භාවිත කර ඇති බවත් ඊට අමතරව යකඩ, තඹ, මැණික්, ඇත්දත් වැනි ද්‍රව්‍ය ද යොදාගෙන ඇති බවත් පැහැදිලි වේ. මෙම කාලපරිච්ඡේදය වන විට ලංකාව ඇත්දළවලට මෙන්ම මැණික්වලට ද ප්‍රසිද්ධ විය. විවිධ රටවල වෙළෙන්දෝ එවැනි සම්පත් සොයා මෙරටට පැමිණියහ. ඒ අනුව, මුල්කාලීන ලංකාවේ ආරාමික

61 Wicremasinghe, 1912, p. 90.
62 මහාවංසය, 1959, පිටු. 27,37.
63 එම, පිටු. 27,38.
64 අභයගිරිය ව්‍යාපෘතිය කැණීම් වාර්තා, 1988, පි. 136.
65 මහාවංසය, 1959, පිටු. 37,101.
66 Paranavithana, 1970, page 62,807.

ගොඩනැගිලි අංග ඉදිකිරීමේදී විනය පිටකයේ දක්වා ඇති ඉදිකිරීම් මාධ්‍ය යොදාගෙන ඇති අතර දේශීය ද්‍රව්‍ය භාවිතයට ගැනීමෙන් අනන්‍යතාවක් ගොඩනගාගෙන ඇති බව පැහැදිලි වේ.

**නිගමනය**

මේ අනුව බුද්ධකාලයේ ඉන්දියාවේ ආරාමික ගොඩනැගිලි නිර්මාණයේදී ඉදිකිරීම් මාධ්‍ය වශයෙන් දැව, ගඩොල්, ගල්, රෙදි, ගල් පුවරු හා හුණු බදාම යොදාගෙන ඇති බව ත්‍රිපිටකාගත සාධක අනුව තහවුරු කළ හැකිය. සෙවිලි මාධ්‍ය වශයෙන් උළු, විවිධ තෘණ වර්ග හා කොළ වර්ග භාවිත කර තිබේ. ශ්‍රී ලංකාවේ ආරාමික ගොඩනැගිලි ඉදිකිරීම මුල්කාලයේ සිට ම විනයානුකූල පදනමක් මත පිහිටා සිදුකර තිබේ. ඉදිකිරීම් ද්‍රව්‍ය භාවිතයේදී ත්‍රිපිටකාගත පැනවීම් අතික්‍රමණය කළ බවක් දක්නට නොලැබේ. කාලීන සහ දේශීය අවශ්‍යතා අනුව යමින් ශ්‍රී ලාංකේය නිර්මාණ ශිල්පියා ඉදිකිරීම් අමුද්‍රව්‍ය යොදාගෙන තිබේ. ඊට අමතරව ශ්‍රී ලාංකේය පරිසරයට අනුගත වෙමින් සියුම් කලාංග නිර්මාණයෙහිලා යකඩ, තඹ, රන්, මැණික් මෙන්ම ඇත්දත් භාවිත කළ බවට සාධක ඇත.

**ආශ්‍රිත ග්‍රන්ථ නාමාවලිය**

**ප්‍රාථමික මූලාශ්‍රය**

**අභයගිරිය විහාර** ව්‍යාපෘතිය අනුරාධපුරය, කැණීම් වාර්තාව, 1988, කොළඹ, මධ්‍යම සංස්කෘතික අරමුදල.

**අභයගිරිය විහාර** ව්‍යාපෘතිය අනුරාධපුරය, සංරක්ෂණ වාර්තාව, 1981, කොළඹ, මධ්‍යම සංස්කෘතික අරමුදල.

**චුල්ලවග්ගපාළි, චතුර්ථ භාගය,** 2005, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, දෙහිවල, පුනර් මුද්‍රණය.

**පාලන වාර්තා,** 1970-1997, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව, ලංකාණ්ඩුවේ මුද්‍රණාලය.

**මහාවග්ගපාළි, චතුර්ථ භාගය,** 2005, බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, දෙහිවල, පුනර් මුද්‍රණය, බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.

**මහාවංසය** (සිංහල පරි), 1959, සංස්ඃ පොල්වත්තේ බුද්ධදත්ත හිමි, කොළඹ, ඇම්.ඩී. ගුණසේන සහ සමාගම.

**ශිලාලේඛන සංග්‍රහය**, 2000, සංස්. දොන් මර්තීනු ද සිල්වා වික්‍රමසිංහ, කොළඹ, පුරාවිද්‍යා දෙපාර්තමේන්තුව.

**ප්‍රාථමික මූලාශ්‍රය (ඉංග්‍රීසි)**

**Abhayagiri vihara Project Anuradhapura:** Excavation, 1982, Colombo, Central Cultural Fund.

**Jetavanaramaya Project Anuradhapura:** Archaeological Excavation, 1982, Colombo Central Cultural Fund.

Paranavitana S, 1943, **Epigraphia Zeylanika,** Volume I, London, Oxford University press.

Paranavitana S, 1943, **Epigraphia Zeylanika,** Volume IV, London Oxford University press.

Paranavitana S, 1963, **Epigraphia Zeylanika,** Volume V, London Oxford University press.

Paranavitana S, 1965, Godakumbura C.E., **Epigraphia Zeylanika,** Volume V, Archaeological Department Ceylon.

Paranavitana S, 1970, **Inscriptions of Ceylon,** Volume I, Department of Archaeology Ceylon.

Paranavitana S, 1949, **Report on the Archaeological Survey of Ceylon,** Colombo, Ceylon Government press.

**ද්විතීයික මූලාශ්‍රය (සිංහල)**

කුලතුංග ටී. ජී, 2001, අභයගිරි ලිපි, කර්තෘ ප්‍රකාශනයකි.

ගමගේ, ගුණසේන, 2006, පැරණි ලක්දිව තාක්ෂණවේදය සහ ශිල්ප ඥානය 1, කර්තෘ ප්‍රකාශනයකි.

ගුණවර්ධන ප්‍රිශාන්ත, 2010, ශ්‍රී ලංකාවේ පැරණි සංඝාරාම, ජාඇල, සමන්ති පොත් ප්‍රකාශකයෝ.

ගුරුගේ, ආනන්ද, 1998, දඹදිව බෞද්ධ කලාව, කොළඹ, කරුණාරත්න සහ පුත්‍රයෝ.

තාපර්, රොමිලා, 1973, ඉන්දියාවේ ඉතිහාසය, අධ්‍යාපන දෙපාර්තමේන්තුව.

බෂාම්, ඒ එල්, 1995, අසිරිමත් ඉන්දියාව, අධ්‍යාපන දෙපාර්තමේන්තුව.

ලගමුව, ඒ, 2002, උපෝසථඝරය, නුගේගොඩ සරසවි ප්‍රකාශකයෝ.

### ද්විතීයික මූලාශ්‍රය (ඉංග්‍රීසි)

Bandaranayake, Senake, 1974, **Sinhalese Monastic Architecture,** Leiden.

Silva, Roland, 2004, **Thūpaghara and Thūpa-pāsāda Memoirs of the Archaeological Survey of Ceylon,** Volume x, Colombo, Department of Archeology.